# ලංකා බැංකුව

ලංකා බැංකුව යනු ලන්ඩනයේ බැංකු අනුබද්ධිත ආයතනයක් ඇතුළු විදෙස් රටවල් ගණනාවක ක්‍රියාත්මක වන දිවයින පුරා ශාඛා ජාලයක් ඇති ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුවයි.

ලොව ප්‍රමුඛ පෙළේ බැංකු 1000 අතරට ශ්‍රේණිගත කර ඇති එකම ශ්‍රී ලාංකික බැංකුව මෙන්ම, ශ්‍රී ලංකාවේ අංක 01 බැංකුවද වන අප පහත සඳහන් තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සහිත පළපුරුදු පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තොරතුරු ආරක්ෂණ සහ තහවුරු කිරීමේ නිලධාරී
## (Information Security and Assurance Officer)

### යෝග්‍යතා නිර්ණායක

➢ **ශ්‍රී ලාංකීය පුරවැසියකු විය යුතුය.**

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු ආරක්ෂණය / සයිබර් ආරක්ෂණය (Information Security / Cyber Security) පිළිබඳ අවම වශයෙන් දෙවන පන්තියේ ඉහළ පෙළ සාමාර්ථයක් සහිත උපාධියක් ලබාගෙන තිබීම

  හෝ

- ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය (තොරතුරු / සයිබර් ආරක්ෂණය පිළිබඳ විශේෂ) (Computer Science / Information Technology Specializing in Information / Cyber Security) පිළිබඳ අවම වශයෙන් දෙවන පන්තියේ ඉහළ පෙළ සාමාර්ථයක් සහිත උපාධියක් ලබාගෙන තිබීම

  සහ

- තොරතුරු ආරක්ෂණය, තාක්ෂණ අවදානම් කළමනාකරණය හෝ තොරතුරු ආරක්ෂාව පිළිබඳ විගණනය යන ක්ෂේත්‍රයන් හි අවම වශයෙන් වසරක (01) පළපුරුද්ද

- පහත සඳහන් වෘත්තීයමය සුදුසුකම් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

  CISSP සහ / හෝ CISM හෝ මෙම මට්ටමේදී පෙන්නුම් කරන ලද තාක්ෂණික කුසලතා, CISA, CISM, CRISC, CEH, CompTIA Pen Test+, GIAC Penetration Tester (GPEN), SSCP, CCNA - Security, CYSA+, GICSP, GSEC, Certified Identity and Access Manager (CIAM) හෝ Certified Identity Management Professional (CIMP) හෝ අදාළ සහතිකය

➢ **වෙනත් සුදුසුකම්**

- බැංකුවේ අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය උනන්දුව හා කැපවීම
- පීඩනයන් යටතේ ඵලදායීව වැඩකිරීමේ හැකියාව
- කණ්ඩායමක් සමග වැඩකිරීමේ හැකියාව ඇතුළු අන්තර් පුද්ගල කුසලතා
- නායකත්ව ගුණාංගයන්ගෙන් යුක්ත වීම
- නව්‍ය අදහස් සහිත වීම හා අනුගතවීමේ හැකියාව

➢ **වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 හෝ ඊට අඩු විය යුතුය.

### නියමයන් හා කොන්දේසි

➢ මෙම තනතුර බැංකු සේවයෙහි සාමාන්‍ය නියමයන් හා කොන්දේසිවලට යටත් වන නමුදු සාමාන්‍ය බැංකු ක්ෂේත්‍රයට පරිබාහිර (සංවෘත සේවය) වේ.

➢ පරිවාස කාල සීමාවේ බැංකුව සෑහීමකට පත්වන ආකාරයට අවශ්‍යතා සපුරාලමින් වසරක (01) පරිවාස කාලයකින් පසු, තොරතුරු ආරක්ෂණ හා තහවුරු කිරීමේ නිලධාරී (Information Security and Assurance Officer) ලෙස බැංකු සේවයේ ස්ථිර කරනු ලැබේ.

➢ තනතුරට අදළ වැටුප් පරිමාණය :

රු. 90,645/- - රු. 115,045/-

රු. 1,220 X 20

*(විචල්‍ය ජීවන වියදම් දීමනාව සමග ආසන්න ආරම්භක දළ වැටුප මසකට රු. 189,000/- පමණ වේ)*

➢ කාර්යාල වේලාවට අමතරව හා සති අන්තයේ / නිවාඩු දිනවල සේවයෙහි යෙදීම අපේක්ෂා කෙරේ.

### තෝරාගැනීමේ පටිපාටිය

➢ යෝග්‍යතා පරීක්ෂණයකින් හා ඉන්පසුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් මගින්

➢ යෝග්‍යතා පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමට පමණක් යොදගනු ලැබේ. අවසාන තෝරාගැනීම් සිදුකරනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු මත පමණක් පදනම්වය.

### අයදුම්කිරීමේ පටිපාටිය

➢ ඔබේ අයදුම්පත අපගේ වෙබ් අඩවිය වන www.boc.lk ("careers" තිරය) හරහා **2025.06.14 වන දින හෝ ඊට පෙර** ඉදිරිපත් කරන්න. ඉදිරි කටයුතු සඳහා "අයදුම්පතේ යොමු අංකය" ඔබේ ළඟ තබාගන්න.

➢ කරුණාකර **Careers Page** හි ඇති අපේක්ෂකයන් සඳහා වන උපදෙස් සැලකිල්ලෙන් යුතුව කියවා, දී ඇති උපදෙස් අනුව මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කරන්න.

➢ ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සපුරා නොමැති හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කරන හෝ ඕනෑම ඉල්ලුම්පතක් බඳවාගැනීමේ ඕනෑම අදියරකදී කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. යම් අයදුම්කරුවකු විසින් සහතික පරීක්ෂා කරන අවස්ථාවේදී ඉහත නියමිත යෝග්‍යතා නිර්ණායක සනාථ කිරීම සඳහා ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, ඔහුගේ / ඇයගේ අයදුම්පත වහාම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

➢ ඉල්ලුම්කරු විසින් අපගේ වෙබ් අඩවියේ **(https://www.boc.lk/hr-management)** ඔස්සේ පිවිසිය හැකි මානව සම්පත් කළමනාකරණ පිටුවේ ඇති *"බඳවාගැනීම් සඳහා වන පෞද්ගලික දත්ත ආරක්ෂණ දැන්වීම"* ඉල්ලුම්කරන අවස්ථාවේදී කියවා එය පිළිගත යුතුය.

**මානව සම්පත් අංශය,**
**ලංකා බැංකුව,**
**ප්‍රධාන කාර්යාලය, කොළඹ 01.**

- *බැංකුව වෙත කුමන අයුරකින් හෝ බලපෑමක් කිරීම ඔබ මෙම තනතුර සඳහා වහාම නුසුදුසු බවට පත්කිරීමට හේතුවේ.*
- *තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවීමේ අයිතිය බැංකුව සතුය.*
- *සම්පූර්ණ කළ යුතු තනතුරු සංඛ්‍යාව තීරණය කිරීමේ හෝ බඳවාගැනීම කල්දැමීමේ / අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.*
- *බැංකුවේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව බැංකුව විසින් ඔබේ තොරතුරුවල පෞද්ගලිකභාවය හා රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබේ.*


1975 BOC CALL CENTRE
www.boc.lk
AA-(lka) Fitch ශ්‍රේණිගත කිරීම AAA Brand Finance ශ්‍රේණිගත කිරීම.
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
යෝජනා/අදහස්/පැමිණිලි සඳහා - https://www.boc.lk/contact
ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය,
අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.
ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ